ISSN 2362-0412

# ථේරවාදී ධර්ම විනය ආරක්ෂා කර ගැනීමෙහි ලා භාණකවරුන්ගේ මෙහෙවර පිළිබඳ විමර්ශනයක්

උණුවතුර බුබුලේ මහින්ද හිමි

*පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*

*mahindabubule@gmail.com*

**සාරසංක්ෂේපය**

අපගේ විමර්ශනයට භාජන වන භාණකවරුන් වූ කලි ථේරවාදී ධර්ම විනය ශත වර්ෂ හතරක් තරම් වූ දීර්ඝ කාලයක් තිස්සේ වන පොත් කිරීමෙන් ගුරු-ශිෂ්‍ය පරම්පරානුයාත ව අඛණ්ඩ ව පවත්වාගෙන ආ දූර දර්ශීවූත්, උත්ථාන වීර්යයෙන් පරිපූර්ණවූත් සුපේශල ශික්ෂාකාමී බෞද්ධ යතිවරුන් හා ධර්ම-විනය යන්නට සූත්‍ර විනය අභිධර්ම යන සමස්ත ත්‍රිපිටක ධර්මය ම අන්තර්ගත වෙයි. ඒ අනුව මුළු ත්‍රිපිටක ධර්මය ම නොනැසී ආරක්ෂා කරගනිමින් පවත්වාගෙන ආවාහු භාණකයෝ වෙති. ලේඛන කලාව දියුණු මට්ටමකින් නොපැවැති අතීතයේ දී ත්‍රිපිටක ධර්මය පමණක් නොව, ඒ වන විට ලොව පහළ ව පැවැති සියලු සමය සමයාන්තරයන් නොනැසී පැවැතුණේ වාචෝද්ගත මාර්ගයෙනි. වසර දහස් ගණනක් තිස්සේ වේද වේදාන්ත දර්ශනයන් වන පොත් කර ගනිමින් ආරක්ෂා කරගෙන ආ පිරිස් හැඳින්විය යුත්තේ ද භාණකයන් නමිනි. ඒ අනුව භාණක සම්ප්‍රදායේ ආරම්භය ප්‍රාග් බෞද්ධ යුගය දක්වා ඈතට විහිදී යයි. බෞද්ධ භාණක සම්ප්‍රදාය ආරම්භවන්නේ බුදුරදුන් ජීවමාන ව වැඩ වෙසෙන අවදියේ දී ය. බුදු සසුනෙහි ප්‍රථම භාණකවරයා ලෙස හැඳින්විය හැක්කේ බුද්ධෝපස්ථායක ආනන්ද මහ තෙරුන්වහන්සේ ය. උන්වහන්සේ එම පදවියට පත්වන්නේ බුද්ධත්වයෙන් විසි වසරක් ගෙවී ගිය අවස්ථාවේ දී වුවත්, එම පදවිය භාර ගැනීමේ දී උන් වහන්සේගේ ප්‍රධාන ඉල්ලීමක් වූයේ, බුදුරදුන් ඒ දක්වා දේශිත ධර්මයත්, එතැන් සිට ඉදිරියට දේශනා කරනු ලබන සියලු ම ධර්මයත්, තමන්ට පෞද්ගලික ව දේශනා කළ යුතු බව ය. ඒ අනුව, බුද්ධත්වයේ සිට පරිනිර්වාණය දක්වා බුදුරදුන් දෙසූ සියලු ධර්ම දේශනා අසා දැන ධාරණය කරගත් තැනැත්තා ආනන්ද මහ තෙරුන්වහන්සේයි. බෞද්ධ සාහිත්‍යයට අනුව, විශිෂ්ට ධාරණ ශක්තිය ඇත්තවුන් අතර අග්‍රස්ථානය හිමිවන්නේ ආනන්ද තෙරුන්ටය ධර්ම භාණ්ඩාගාරික, බහුස්සුත, ජාති මරණ පාරගූ, සද්ධම්මධාරක, නිරුත්ති පද කෝවිද, ධම්මධර මහා පඤ්ඤ, ධිතිමන්ත, යතිමන්ත ආදී විශේෂණ පද රාශියක් උන් වහන්සේ හැඳින්වීම සඳහා භාවිත කර තිබීමෙන් ම උන් වහන්සේගේ අද්විතීය ධාරණ ශක්තිය තහවුරු වෙයි. බෞද්ධ භාණක සම්ප්‍රදාය විධිමත් ලෙස ස්ථාපිත වූයේ ප්‍රථම ධර්ම සංගායනාවේ දී ය. ආනන්ද මහතෙරුන් වහන්සේ එතෙක් තමන් ධාරණය කරගෙන සිටි සියලු ම ධර්ම-විනය කොටස් සංගීති කාරකයන් හමුවෙහි දී සජ්ඣායනය කිරීමෙන් පසු, වනපොත් කිරීමේ හා අඛණ්ඩ ව පවත්වාගෙන යාමේ අරමුණින් තෝරා ගන්නා ලද භික්ෂු කණ්ඩායම් වෙත භාර දී තිබේ. භාණක ගණ ලෙස හැඳින්වෙන්නේ එසේ භාර වූ භික්ෂු පිරිස් ය.මිහිඳු මහ රහතන් වහන්සේ මෙරටට රැගෙන ආවේ එසේ මුඛ පරම්පරාගත ව පැවත ආ ථේරවාදි ධර්ම-විනයයි. ධර්මය ආරක්ෂා කර ගැනීම උදෙසා ඉන්දියාවේ දී අනුගමනය කරන ලද මුඛ පරම්පරාගත වාචනා ක්‍රමය ලංකාවේ දී ද ක්‍රියාත්මක වූයේ ඒ වන විටත් ලේඛන කලාව ප්‍රශස්ත මට්ටමක නොපැවති බැවිනි. එහි ප්‍රතිඵලය වූයේ බෞද්ධ භාණක සම්ප්‍රදාය ලංකාවේ ද ක්‍රියාත්මක වීම යි.ත්‍රිපිටක ධර්මය ප්‍රථම වරට ග්‍රන්ථාරූඪවන්නේ වළගම්බා රාජ්‍ය සමයේ දී ලංකාවේ දී ය. එතෙක් ථේරවාදී ධර්ම විනය ආරක්ෂා කරගනිමින් පවත්වාගෙන ආවේ භාණක ගණයන් විසිනි. භාණකවරුන්ට පැවරුණු කාර්ය භාරය වූයේ ධර්ම විනයෙහි නියමිත කොටසක් වන පොත් කරගෙන, තම ශිෂ්‍ය පරම්පරාව තුළින් එය අඛණ්ඩ ව පවත්වාගෙන යාම ය. ඒ ඒ ගණ හැඳින්වූණේ ඔවුන් වන පොත් කළ ධර්ම කොට්ඨාසය අනුව ය. එබඳු භාණක ගණ 18 ක් ඓතිහාසික මූලාශ්‍රවල දැක්වේ.දීඝ භාණක, මජ්ඣිම භාණක, සංයුත්ත භාණක, විනය භානක, අභිධම්ම භාණක, සුත්තන්ත භාණක, අංගුත්තර භාණක, ඛුද්දක භාණක, අට්ඨකථා භාණක, අක්ෂර භාණක, මාතිකා භාණක, ජාතක භාණක, ධම්මපද භාණක, මහානිද්දේස භාණක, උභතෝ විභංග භාණක, ඛන්ධක භාණක, මහාපකරණ භාණක, සබ්බ පරියත්ත භාණක, භාණක සම්ප්‍රදාය දීර්ඝ කාලයක් පැවැතීමට ඉවහල් වූයේ එහි සැලසුම් සහගත ව්‍යූහයයි. උගත් වැඩිහිටි භික්ෂූන් හා අධුනිකයන් නිතර රැස්වීම, වනපොත් කිරීම හා ඒවා වාචෝද්ග්‍රහණය කිරීම, භාණක චාරිත්‍ර පිළිපැදීම හා භාණකයන් සඳහා දීමනා ක්‍රමයක් ක්‍රියාත්මක වීම එහි සාර්ථකත්වයට හේතු වී තිබේ. තර්කානුකූල පදනමක් යටතේ ධර්ම විනය අනාගත පරම්පරාවට ප්‍රේරණය කිරීම ද භාණක සම්ප්‍රදායේ ස්ථාවරත්වයට මහඟු පිටුවහලක් වූ බව පෙනී යයි. ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමත් සමඟ භාණකයන්ගේ කාර්ය භාරය ක්‍රමයෙන් අහෝසි වී ගිය ද ග්‍රන්ථාරූඪ කිරීමට හෝ පරිශීලනය කිරීමට හෝ එතෙක් ත්‍රිපිටක ධර්මය ආරක්ෂා වූයේ භාණකවරුන් නිසා බව නිසැක ය.

***ප්‍රමුඛ පද:*** *ථේරවාද, භාණක ගණ, ධර්ම විනය, ත්‍රිපිටක ග්‍රන්ථාරූඪය, වනපොත් කිරීම.*